# තනතුරු පුරප්පාඩු

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්) - HM-1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කලා හෝ වාණිජ හෝ විද්‍යා හෝ යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමග එම විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබා ගත් විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධිය,

සමග

**පළපුරුද්ද :**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ " (MM 1-1)" තනතුරකට, සමාන තනතුරක පහත "ඇ" ඡේදයේ විෂය ක්ෂේත්‍රයන්ට අදාලව අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ (MM 1-1) පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් තිබීම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ස්ථාපිත සැලැස්ම හා මාර්ග සැලැස්ම අනුව දැනුවත් කිරීම් අංශයේ කටයුතු උපායමාර්ගිකව සැළසුම් කිරීම.

(2) ආපදා කළමනාකරණය හා ආපදා අවදානම අවම කිරීම පිළිබඳව පාසල් සිසුන් අතර, අධ්‍යාපන ආයතන තුළ, රාජ්‍ය සේවකයින් හා පොදු මහජනතාව අතර දැනුවත් භාවය ඉහළ නැංවීම හා ඒ සඳහා වන උනන්දුව ඉහළ නැංවීම.

(3) විශ්වවිද්‍යාල විෂය මාලාව තුළට ආපදා අවදානම අවම කිරීම ඇතුළත් කිරීමට කටයුතු කිරීම හා ඒ සඳහා උපාධිධාරීන්ට පහසුකම් සැපයීම හා දැනුවත් භාවය වැඩි කිරීම.

(4) අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසල් ආරක්ෂණ වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම.

(5) පුහුණු හා කෙටි පාඨමාලා මගින් වෘත්තීමය කණ්ඩායම් අතර ආපදා කළමනාකරණය හා ආපදා අවදානම අවම කිරීම පිළිබඳව දැනුවත් බව වැඩි කිරීම.

(6) රාජ්‍ය / පුද්ගලික ආයතනයන්හි නිලධාරීන් පුහුණු කිරීම හා රාජ්‍ය ආයතනයන් සඳහා පුහුණු ආම්පන්න සැපයීම මගින් එම ආයතනයන්හි ආපදා කළමනාකරණ ධාරිතාව ඉහළ නැංවීම.

(7) අඛණ්ඩ අධ්‍යාපන විෂය පථයට ආපදා කළමනාකරණය ඇතුළත් කිරීම සඳහා කටයුතු කිරීම.

(8) ජාතික ආපදා කළමනාකරණ සභාවේ රැස්වීම් සම්බන්ධීකරණය.

(9) ආපදා කළමනාකරණය හා ආපදා අවම කිරීම පිළිබඳව කොළඹ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල සේවක මණ්ඩලය පුහුණු කිරීම.

(10) අවශ්‍ය වූ විට ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කිරීම.

(11) දැනුවත් කිරීම් අංශයේ වාර්ෂික අයවැය සැකසීම, ව්‍යාපෘති සැකසීම, භෞතික හා මූල්‍යමය ප්‍රගතිය අධීක්ෂණය.

(12) දැනුවත් කිරීම් අංශයේ සේවක මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය හා එමගින් එම අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය කාර්යාලීය පරිසරය සැකසීම.

(13) ඉහත රාජකාරීන්ට අමතරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට පවරනු ලබන මෙම තනතුරට අදාළ රාජකාරීන්ද ඉටු කිරීමට බැඳී සිටිය යුතුය.

**ඈ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

HM 1-1 - 2016- රු.81,670-15x2,270-115,720.00 ජීවන වියදම් දීමනාව, වෘත්තිය දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**වෙනත් පහසුකම් :**

2015.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 01/2015 අනුව නිල රථය / ප්‍රවාහන දීමනාව සමග ඉන්ධන දීමනාවද, 2022.01.18 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2022 අනුව සන්නිවේදන පහසුකම් ලබාදීම.

**ඉ. වයස :**

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ඊ. පත්වීමේ ස්වභාවය :**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවාදායකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

බාහිර අයදුම්කරුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය එක් අවුරුදු වැඩබැලීමේ කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

**උ. වෙනත් අවශ්‍යතා :**

සෑම අයදුම්කරුවෙක්ම,

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(2) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(3) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**ඌ. අයදුම්පත් එවිය යුතු ආකාරය :**

අයදුම්පත **www.dmc.gov.lk** වෙබ් අඩවියේ පළ කොට ඇති අතර, ඒ අනුව සකස් කර ගත් අයදුම්පත් 2023.01.07 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අංක 120/2, විද්‍යා මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහිර එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්)"** යන්න හා අයදුම් පත්‍රයේ බාහිර අයදුම්කරුවෙකුද, අභ්‍යන්තර අයදුම්කරුවෙකුද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කිරීමේදී බාහිර අයදුම්කරුවෙකු ලෙසද අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත.

අයදුම්පත්‍රය සමග අයදුම්කරු සතු සියලුම අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික, උප්පැන්න සහතිකය යන සහතිකයන්හි සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපත් එවීම අනිවාර්යය වේ. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම මධ්‍යස්ථානය වග කියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවන් සිය අයදුම්පත් ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතු අතර, එසේ නොවන සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැලකිය යුතුයි :** මෙම දැන්වීම www.dmc.gov.lk යන වෙබ් අඩවියේද පළකොට ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.**